සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

## පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

**II පත්‍රය**

**නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන**

# "අදිති"

**5**

පැය 01 යි මිනි 15

විභාග අංකය ................................

### විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**01. පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.**

අපේ ගමෙහි එක් කලෙක ගවයන් බහුල වූ නිසා කිරි සුලභ විය. ගවයන් බහුල වීම නිසා එළවළු වතුවලට පෝර ලැබිණ. ගොම පෝර නිසා කුරුමිණියෝ ද කුරුමිණියන් නිසා තලගොයි ද බහුල වූහ. තලගොයින් බහුල වීම නිසා කුරුමිණියන් ද එළවළු ගොවිතැනට බාධාකර වූ කෘමි ගණයේ වෙනත් සතුන් ද වැඩි වීම වැළකිණි. තලගොයින්, කුරුමිණියන් කා-දැමූ බැවිනි. කිරි, එළවළු ආදිය සුලභ වීම නිසා, ගම් වැසියෝ නොපිරිහුණු දේහ ශක්තිය ඇත්තෝ, සන්තුෂ්ටියෙන් ජීවත් වූහ. ඇතැම් විට මෙකී තුල්‍යතාවයට බාධා කළේ මනුෂ්‍යයා ය.

- **ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරා ගෙන තිත් ඉරි මත ලියන්න.**

i. ගමේ කිරි සුලභ වුයේ ඇයි? ......................................................................................

ii. ගොම පෝර නිසා වැඩි වූ සතුන් වර්ගය කුමක් ද? ..................................................................

iii. ගම් වැසියෝ නොපිරිහුණු දේහ ශක්ති ඇත්තෝ වීමට හේතු වුනේ කුමක් ද?

...............................................................................

iv. ''**සමතුලිතතාවයට**'' යන්නට සමාන අර්ථයක් ඇති වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.

...................................................................................................

v. එකිනෙකට වෙනස් මූර්ධජ අකුරු දෙකක් යෙදී ඇති වචනය කුමක් ද?

..........................................................................

vi. ප්‍රාණවාචි බහු වචන උක්ත පදයක් ඡේදයෙන් තෝරා ලියන්න.

.........................................................

**02. හිස් තැනට සුදුසු වචනය තෝරා ලියන්න.**

i. පවනි සෙල්ලම් පන්තිය ආරම්භ .......................................

ii. යෝෂිකෝ දැරියට උදවු ...................................

iii. ළමයි එක හඬින් ...................................

| කළේ ය. / කළා ය. / කීවේ ය./ කීහ. |
|---|

**03. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.**

i. යටතේ/ එතුමා / සත් / ජීවක / උගත්තේ ය./ අවුරුද්දක්

..............................................................................................................................

**04. අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය යටින් ඉරක් අඳින්න.**

i. විශාල, ස්තානය, පුස්ථකාලය

ii. වළාකුලු, ගැටලු, සියළු

**05. ගැළපෙන විරාම ලකුණු යොදන්න.**

| **මැස්සෙකුයි ගෙම්බෙකුයි ඉත්තෑවෙකුයි කුකුළෙකුයි ගස් කොටයක් උඩ ගෙයක් සාදාගෙන උන්නා** |
|---|

**06. පහත ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.**

i. ගඟට ............................ වගේ

**07. දී ඇති අදහසට ගැළපෙන ඉඟි වැකිය තිත් ඉර මත ලියන්න.**

i. ඉතාම ස්වල්ප ප්‍රමාණයක් ..........................................................................................

08. හිස්තැන් පුරවන්න.

| | පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග |
|---|---|---|
| i | නළුවා | |
| ii | | කිවිඳිය |

09. දී ඇති වැකි ලිඛිත භාෂාවට හරවා ලියන්න.

i. අක්කා සවස බුදුන් වැන්දා - ..............................................................................

ii. අපි හොඳින් ක්‍රීඩා කරනවා - ..............................................................................

10. සුදුසු යුගල පදය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. කුඩා ළමයි ................................... ලැබීමෙන් සතුටු වෙති.

ii. ............................................ අය සමඟ සමගියෙන් ජීවත් වෙමු.

තෑගි බෝග / ගමන් බිමන් / අහල පහල

11. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

i. මා පාසල් නිවාඩුව අවසන් වන තෙක් .................................. ගනිමින් සිටියෙමි. (ඇඟිලි/ඇඟිළි)

ii. විදුහල්පතිතුමා විද්‍යාලයේ ................................ ගොඩනැගිල්ල පරීක්ෂා කළේ ය. (පරිඝනකාගාර/ පරිගණකාගාර)

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.



i. ..............................



ii. .................................

පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

i. I / have / a /book - ..............................................................................

ii. to / the / Ran / wall - ..............................................................................

13. දී ඇති ඉංග්‍රීසි වාක්‍යයේ අදහස සිංහලෙන් ලියන්න.

come back - ..............................................................................

14. i. (15) මෙම සංඛ්‍යාවේ දෙමළ වචනය සිංහල අකුරුවලින් ලියන්න.

..............................................................................

15. ii. "උංගළුක්කු මාම්පළම් වේණ්ඩුමා?" යන දෙමළ වාක්‍යයේ සිංහල තේරුම ලියන්න.

..............................................................................


iii. 

මෙම රූපය හඳුන්වන දෙමළ වචනය සිංහල අකුරු යොදා ලියන්න.

..............................................................................

- **පිළිතුරු සපයන්න**

16.




i. ගණක රාමුවෙන් නිරූපිත සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

.................................................................................................

ii. ගණක රාමුවේ දැක්වෙන සංඛ්‍යාවේ දහය ස්ථානයේ ස්ථානීය අගය කීය ද?


.......................................

17. පහත තොරතුරු ඇසුරින් හිස්තැන් පුරවන්න.

| සිට | තෙක් | දුර |
|---|---|---|
| කොළඹ | හලාවත | 72 කි.මී. |
| කොළඹ | පුත්තලම | 146 කි.මී. |
| පුත්තලම | අනුරාධපුර | 76 කි.මී. |
| හලාවත | අනුරාධපුර | ................ කි.මී. |




18. පහත දක්වා ඇත්තේ සමානව දෙකට නවන ලද රිබන් පටියකි. එය නැවත දිග හැරිය විට රිබන් පටියේ සම්පූර්ණ දිග සොයන්න. .......................................




19. දී ඇති රූපයේ $\frac{3}{4}$ ක් පාට කරන්න.




20. දශකයක් තුළ ක්‍රිකට් ක්‍රීඩකයන් සිව් දෙනෙක් ලබා ගත් ලකුණු ප්‍රමාණය මෙසේ ය.

| ක්‍රීඩකයා | ලකුණු |
|---|---|
| A | 24249 |
| B | 19163 |
| C | 15497 |
| D | 10987 |

i. A සහ B ක්‍රීඩකයාගේ ලබාගත් ලකුණු සංඛ්‍යාව කොපමණ ද?.......................................

ii. වැඩිම ලකුණු සංඛ්‍යාවක් සහ අඩුම ලකුණු සංඛ්‍යාවක් ලබා ගත් ක්‍රීඩකයන් දෙදෙනා අතර ලකුණු වෙනස කීය ද? .......................................

21. පහත රූපයේ පාට නොකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



.......................................

22. පහත දී ඇති සංඛ්‍යා පිළිවෙළ අනුව සංඛ්‍යා රටාවක් ලෙස ලබා ගැනීමට ඉවත් කළ යුතු සංඛ්‍යා දෙක මොනවා ද?

3 9 27 49 81 125 243 ... ..........................................

23. පාසලක ත්‍යාග ප්‍රදානෝත්සවයක් සඳහා අභ්‍යාස පොත් 636 ක් මිල දී ගන්නා ලදී. පාර්සලයකට පොත් 06 බැගින් ඇතුලත් වන සේ තෑගි පාර්සල් කීයක් සෑදිය හැකි ද?

..........................................

24. තිනිදි තම නිවසට පැමිණියේ ප.ව. 7 ට මිනිත්තු 20 ක් තිබිය දී ය. එම වේලාව සම්මත වේලාවෙන් ලියන්න. ..........................................

25. යසස් යම් ස්ථානයක සිට 5m නැගෙනහිර දිශාවට ගමන් කර ඔහුගේ වම් අත පැත්තට හැරී 10m ක් ගමන් කළේ ය. එතැන් සිට නැගෙනහිර දිශාවට 5m ක් ගොස් නැවතුණි. දැන් ඔහු සිටින්නේ ආරම්භක ස්ථානයේ සිට කුමන දිශාවෙන් ද? ..........................................

26. යොහාන්ගේ බර 68kg කි. ඔහුගේ පුතාගේ බර යොහාන්ගේ බරින් $\frac{1}{4}$ කට වඩා 8kg කින් වැඩි ය. පුතාගේ බර ..........................................


27. රූපයේ දැක්වෙන්නේ ධාරිතාව 2000ml වූ භාජනයකි. මෙය සම්පූර්ණයෙන් ජලය පුරවා නැවත එම ජලය දී ඇති අනෙක් භාජන සම්පූර්ණයෙන් පිරෙන සේ ජලය වත් කළ විට පළමු භාජනයේ ඉතිරිවන ජල පරිමාව සොයන්න.

..........................................




28. එක සමාන ඝනක කැබලි 4 ක් එක මත එක අලවමින් කසුන් ඝනකාභයක් නිර්මාණය කරයි. එහි ඇති මුහුණත් ගණන කීය ද?. ..........................................

- **ලොව පුරා ව්‍යාප්ත වූ කොරෝනා රෝගයෙන් ආරක්ෂා වීම සඳහා ශ්‍රී ලංකාවේ 5 වන ශ්‍රේණියේ සිසුන් පිරිසක් මුඛ ආවරණ පැළඳ ගත් ආකාරය පිළිබඳ තොරතුරු මෙම ප්‍රස්තාරයේ දැක්වේ.**




29. කළු පාට මුඛ ආවරණ පැළඳ ගත් සංඛ්‍යාවට වඩා 20ක් අඩුවෙන් නිල් පාට මුඛ ආවරණය පැළඳ සිටියි.

i. එම සංඛ්‍යාව, ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

ii. අඩුම සහ වැඩිම වර්ණයක් පැළඳ ගත් මුඛ ආවරණ සංඛ්‍යාව අතර වෙනස සොයන්න.

..........................................

- **ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.**

30. පහත දැක්වෙන ශාක කොටස් අතුරෙන් ශාකයට විශාල මෙහෙයක් ඉටු කරන්නේ,
   i. පත්‍ර මඟින්   ii. ගෙඩි මඟින්   iii. මුල් මඟින්
31. වියළි ප්‍රදේශවල වැඩෙන විශේෂ ශාකයක් වන්නේ,
   i. පතොක්   ii. ෆයිනස්   iii. ලංකා දෙල්
32. සතුන් මඟින් මිනිසාට ලැබෙන වාසිදායක තත්ත්වයක් නොවන්නේ,
   i. පොහොර ලබා දීම   ii. කුණු කසල කා දැමීම   iii. ශාක පත්‍ර ආහාරයට ගැනීම
33. මාංශ භක්ෂක කෘමි සතෙකි.
   i. උකුස්සා   ii. බත්කූරා   iii. ඇටිකුකුළා
34. ශ්‍රී ලංකාවේ ඒක දේශික මත්ස්‍යයෙකි.
   i. මල් පුළුට්ටා   ii. දියනයා   iii. හික්මීයා
35. ජලය ප්‍රමාණවත් පරිදි පානය නොකිරීමෙන් මුත්‍රාවල දැකගත හැකි ලක්ෂණයක් නොවන්නේ,
   i. මුත්‍රාවල වර්ණය තද පැහැති වීම
   ii. මුත්‍රා පිට කිරිමේ අපහසුව
   iii. මුත්‍රාවල පැහැයක් දැකගත නොහැකි විම
36. පහත දැක්වෙන ඒවා අතුරෙන් ප්‍රෝටීන් බහුලව අඩංගු ශාකමය ආහාරය කුමක් ද?
   i. බිත්තර   ii. කිරි   iii. සෝයා බෝංචි
37. රූපයේ දැක්වෙන ගමන් විලාසය කුමක් ද?



   i. දලඹු ගමන
   ii. කැන්ගරු ගමන
   iii. අශ්ව ගමන
38. ලංකාවේ දහවල් කාලය පවතින විට එම වේලාවේ දී ම රාත්‍රී කාලය පැවතිය හැකි රටක් වන්නේ,
   i. ඉන්දියාව   ii. නේපාලය   iii. ඇමරිකා එක්සත් ජනපදය
39. ක්ලාන්ත වීමක දී නොකළ යුත්තකි,
   i. දියර වර්ග පෙවීමෙන් වැළකීම
   ii. රෝගියා වටා රොක් වීම
   iii. හොඳින් වාතාශ්‍රය ලැබීමට සැලැස්වීම
40. අවගාරය යොදා ගන්නා කර්මාන්තය වන්නේ,
   i. වඩු කර්මාන්තය   ii. පෙදරේරු කර්මාන්තය   iii. කෘෂි කර්මාන්තය
41. කෙළ බිඳිති මගින් බෝ වන වෛරස් රෝග පාලනය කළ හැකි හොඳම පිළියමකි.
   i. මුඛ ආවරණ පැළඳීම   ii. ලේන්සුවක් භාවිතය   iii. නිතර අත් සබන් දා සේදීම

42. මදුරුවන් අප වෙත ළංවීම වැළැක්වීම සඳහා යොදා ගනු ලබන ස්වාභාවික උපක්‍රමයකි.

i. මදුරුතලා දුම් ගැසීම ii. මදුරු දඟර භාවිතය iii. ආලේපන භාවිතය

43. පොළොවට එකතු වන ඉතා හානිදායක ම අපද්‍රව්‍යකි.

i. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ii. වීදුරු කැබලි iii. පොලිතීන් කොටස්

44. ලංකාවේ පැවැත්වෙන ජාතික උත්සවයකි.


i. ඇසළ උත්සවය ii. නිදහස් උත්සවය iii. දේවස්ථාන මංගල්‍යය

45. බීජ සහ දඬු කැබලි යන දෙක ම මගින් පැළ ලබා ගන්නා ශාකයකි.

i. කංකුං ii. බණ්ඩක්කා iii. මිරිස්

46. අපිරිසිදු ජලය හා ආහාර මගින් බෝවන රෝගයකි.

i. අතීසාරය ii. චිකන්ගුනියා iii. සරම්ප


47.  රූපයේ සිටින්නේ කවුරුන් ද?

i. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා

ii. ආතර්.සී.ක්ලාක් මහතා

iii. ආචාර්ය ටී.බී.ජයා මහතා

48. A.B.C. ලෙස කුඩා බල්බ 03ක් යකඩ ඇණයක්, මකන කැල්ලක්, කඩදාසි කැබැල්ලක් හා වයර් කැබලි කිහිපයක් යොදා ගෙන ලෑලි කැබැල්ලක් මත රූපයේ දැක්වෙන ආකාරයේ ඇටවුමක් සකස් කර ඇත. මෙම ඇටවුම අනුව දැල්වෙන්නේ,




i. A බල්බය

ii. A, C බල්බය

iii. B බල්බය

49. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කරන සේවාවන් වන්නේ,

i. නිවාස ණය ලබා දීම.

ii. විවාහ, මරණ, උප්පැන්න සහතික කිරීම.

iii. වරිපනම් එකතු කිරීම.




50. රාජ්‍ය ලාංඡනයෙහි කඩුවක් අතින් ගත් පලාපෙති මැද සිටින සිංහයාගෙන් මූර්තිමත් වන්නේ,

i. රට හා විනය ගරුක ජනයා

ii. එඩිතර බව හා විනය ගරුක බව

iii. ස්වාධීනත්වය හා එඩිතරකම

51. පහත සඳහන් රූප සටහන් ඇසුරෙන් බරක් ඉහළට එසවීමේ දී අඩුම බලයක් යෙදවිය යුතු ඇටවුම කුමක් ද?

i.  ii.  iii. 

52. ජලය මිලි ලීටර 100 කට ලුණු ග්‍රෑම් 10 ක් මිශ්‍ර කර හොඳින් දියකර හිරු එළිය වැටෙන ස්ථානයක තිබූ විට සිදු වන්නේ,

i. භාජනයේ ජලය සමඟ ලුණු වාෂ්ප වීම

ii. භාජනයේ ජලය වාෂ්ප වී ලුණු මිදී තිබීම

iii. භාජනයේ කිසිවක් ඉතිරි නොවේ

53. ලංකාවේ ප්‍රධාන සුළං විදුලි බලාගාරය  පිහිටි දිස්ත්‍රික්කයකි.

i. මන්නාරම ii. පුත්තලම iii. ත්‍රිකුණාමලය

54. සහනශීලී චර්යාවක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

i. පුද්ගලයාගේ හිසට පහර දෙන ආකාරයෙන් කතා කිරීම

ii. ආචාරශීලි වචන හා භාවිතය

iii. පුද්ගලයින්ට එරෙහි නොවී අදාළ කරුණු සංයමයෙන් කතා නොකිරීම

55. පහත සඳහන් ක්‍රියා අතුරින් විරිතක් වන්නේ,

i. කෑමට පෙර අත් සේදීම ii. වැඩිහිටියන් දුටු විට නැගිටීම

iii. වැඩිහිටියන් සමඟ එකට එක කතා කිරීම

56. උපදේශනාත්මක කාව්‍ය ග්‍රන්ථයකි

i. සැළලිහිණි සංදේශය ii. ලෝවැඩ සඟරාව iii. ජාතක කතා පොත

57. චුම්බකවලට ආකර්ශනය නොවන ද්‍රව්‍ය**කී**.

i. යකඩ ii. වානේ iii. තඹ

58. වාෂ්පවන ජලය නැවත සිසිල් කිරීමෙන් දක්නට ලැබෙන්නේ කුමක් ද?

i. අයිස් ii. ජලය iii. කිසිවක් නොවේ

59. පහත දැක්වෙන රූපික ප්‍රකාශනයෙන් අදහස් වන්නේ,



i. පදිකයින් මාරුවන ස්ථානයකි

ii. පුරුෂ පක්ෂයට පමණි

iii. පාර හරහා ගමන් කිරීම

60. ක්‍රීඩාව යනු මිනිසාගේ කායික හා මානසික සමබලතාවය පවත්වා ගැනීමට අතිශයින් උපකාරී වන දෙයකි. ''**ක්‍රීඩාවේ ඇති වැදගත්කම** ''යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න.
සෑම වාක්‍යක් ම වචන පහකට නොඅඩු විය යුතු ය.
අක්ෂර වින්‍යාසය හා උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.

1. ..........................................................................................................................
..........................................................................................................................

2. ..........................................................................................................................
..........................................................................................................................

3. ..........................................................................................................................
..........................................................................................................................

(නිවැරදි හා පැහැදිලි අත් අකුරු සඳහා ලකුණු 02 ක් ලබා දෙන්න.)